00030

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**අධ්‍යාපනවේදී (ස්වභාවික විද්‍යා) උපාධි වැඩසටහන - පස්වන මට්ටම**

**අවසාන පරීක්ෂණය - 2014**

**ESU3211 - අධ්‍යාපන මනෝවිද්‍යාව**

**කාලය - පැය තුනයි.**

---

**දිනය - 2014.02.24** **වේලාව - පෙ.ව.09.30 - ප.ව. 12.30**

---

**I වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, II වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

**I වන කොටස**

01. අධ්‍යාපන මනෝ විද්‍යාවට අදාළව, ගුරුවරයකුගේ ප්‍රධාන භූමිකා තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න.

02. 'සමස්ත සංවර්ධනය' යන සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න.

03. ළමයකුගේ 'පරිණතිය' සහ 'ඉගෙනුම' අතර පවතින සම්බන්ධතාව කෙටියෙන් විස්තර කරන්න.

04. 'සූදානම' යන සංකල්පය නිදසුන් දෙකක් (02) දක්වමින් සාකච්ඡා කරන්න.

05. පියාජේ විසින් හඳුන්වාදෙන ලද සංවර්ධන අවධි අතුරින් තෝරාගත් ඕනෑම අවධියක ප්‍රධාන ලක්ෂණ කෙටියෙන් පරීක්ෂා කරන්න.

06. 'පෙළඹීම' යන සංකල්පය, ඔබේ වචනයෙන් නිර්වචනය කරන්න.

07. පාඩම පුරාම ශිෂ්‍යයන්ගේ අවධානය පවත්වාගැනීම සඳහා ගුරුවරයෙකුට භාවිත කළ හැකි ක්‍රම ශිල්ප තුනක් (03) නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

08. ආත්මකේන්ද්‍රීය චින්තනය හේතුවෙන් නවයොවුන් වියේ පසුවන පුද්ගලයන් මුහුණ දෙන ගැටලු තුනක් (03) සාකච්ඡා කරන්න.

( ලකුණු 5 x8 = 40 )

## II වන කොටස

09. (i) ප්‍රජානන සංවර්ධන ක්‍රියාවලිය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) ප්‍රජානන සංවර්ධනය කෙරෙහි බලපාන සාධක දෙකක් (02) සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(iii) ශිෂ්‍යයන්ගේ ප්‍රජානන සංවර්ධනය සඳහා ගුරුවරයෙකුට සහය විය හැක්කේ කෙසේදැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 07)

10. (i) පෙළඹීම පිළිබඳ ෆ්‍රොයිඩ්ගේ 'මනෝවිශ්ලේෂණවාදී න්‍යාය' කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) ඉගෙනුම කෙරෙහි ස්වයං පෙළඹීමේ ඇති වැදගත්කම පරීක්ෂා කරන්න. (ලකුණු 06)

(iii) ශිෂ්‍යයන් ඉගෙනුම කරා පෙළඹවීම සඳහා වන ගුරු භූමිකාව කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

11. (i) ප්‍රධාන ඉගෙනුම් න්‍යාය කාණ්ඩ තුන සඳහන් කර එම කාණ්ඩ තුන අතර පවතින අසමානතා කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(ii) එක් කාණ්ඩයකින් එකක් (01) බැගින් වනසේ එම කාණ්ඩවලට අයත් න්‍යායයක් තෝරාගෙන එම න්‍යායයේ ප්‍රධාන මූලධර්ම සාකච්ඡා කරන්න. (න්‍යායයන් 3 කට අදාලව සාකච්ඡා කලයුතුව ඇත.) (ලකුණු 08)

(iii) ඉහත න්‍යායයන් අතුරින් ඕනෑම එකක ප්‍රධාන මූලධර්ම පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට යොදාගත හැකි ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 06)

12. (i) 'පෞරුෂය' යනු කුමක් ද?

(ii) තෝරාගත් ඕනෑම පෞරුෂ න්‍යායක ඇති මූලික මූලධර්ම සඳහන් කර පෞරුෂ සංවර්ධනයට අදාලව ඒවායේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) ශිෂ්‍යයන් තුළ සමබර පෞරුෂයක් ඇති කර ගැනීම සඳහා ගුරුවරයෙකුට කෙසේ සහය විය හැකිදැයි සාකච්ඡා කරන්න.

13. (i) 'චිත්තවේග' යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ii) චිත්තවේග සහ පුද්ගල සංවර්ධනය අතර ඇති සම්බන්ධතාව කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 07)

(iii) ශිෂ්‍යයන් තුළ සමබර චිත්තවේග සංවර්ධනයට අදාළව ගුරුවරයාගේ භූමිකාව පරීක්ෂා කරන්න.

(ලකුණු 08)

14. පහත දැක්වෙන තේමාවලින් ඕනෑම තුනක් (03) සඳහා කෙටි සටහන් ලියන්න.

(i) පුද්ගලයකුගේ සංවර්ධනය කෙරෙහි ආරයේ සහ පරිසරයේ ඇති වැදගත්කම.

(ii) ශිෂ්‍ය චර්යාව අධ්‍යයනය සඳහා භාවිත කළ හැකි පර්යේෂණාත්මක ක්‍රමය හා පර්යේෂණාත්මක නොවන ක්‍රම අතර ඇති වෙනස්කම්

(iii) ළමාවියේ සහ නවයොවුන්වියේ චර්යාත්මක ලක්ෂණ

(iv) විගොට්ස්කිගේ ප්‍රජානන සංවර්ධන න්‍යාය

(ලකුණු 6 x 3 +2 = 20 )

(මුළු ලකුණු 100)

හිමිකම් ඇවිරිණි.

**THE OPEN UNIVERSITY OF SRI LANKA**
**BACHELOR OF EDUCATION (NATURAL SCIENCES)**
**DEGREE PROGRAMME – LEVEL 5**
**FINAL EXAMINATIONS – 2014**
**ESU3211 – EDUCATIONAL PSYCHOLOGY**
**DURATION – THREE (03) HOURS.**

Date: 24th February 2014 Time: 9.30 a.m. 12.30 p.m.

**Answer all questions in Part I & any three (03) questions from Part II.**

## PART I

01. Explain briefly **three (03)** main roles of a teacher in relation to Educational Psychology.

02. Explain briefly the concept 'Total Development'.

03. Describe briefly the relationship between 'maturity' and 'learning of a child'.

04. Citing **two (02)** examples discuss the concept, 'readiness'.

05. Examine briefly the main characteristics of any one of the selected stages of development, introduced by Piaget.

06. Define the concept, 'motivation' in your own words.

07. Citing suitable examples, explain **three (03)** techniques that could be used by teachers to maintain students attention throughout a lesson.

08. Discuss **three (03)** problems faced by individuals during adolescence due to their egocentric thinking.

(5 x 8 = 40 marks)

## PART II

09. i. Briefly explain, the process of cognitive development.

(05 marks)

ii. Discuss **two (02)** factors that influenced cognitive development.

(08 marks)

iii. Explain briefly how a teacher could support the cognitive development of the students.

(07 marks)

10. i. Explain briefly the psychoanalytic theory of motivation forwarded by Freud.

(06 marks)

ii. Examine he importance of self motivation towards learning.

(06 marks)

iii. Discuss briefly the role of the teacher in motivating students towards learning.

(08 marks)

11. i. State **three (03)** categories of learning and briefly discuss the difference among them.

(06 marks)

ii. Select any theory from each category and discuss the basic principles of those theories (altogether three theories)

(08 marks)

iii. Discuss the application of principles of any one of the theories mentioned above in classroom teaching-learning.

(06 marks)

00030

12. i. What is 'personality'?

(05 marks)

ii. Mention the main principles of any selected theory of personality and discuss the importance of those principles with relevant to the personality development.

(07 marks)

iii. Discuss how a teacher could support students to develop a balanced personality.

(08 marks)

13. i. Explain briefly the term 'Emotions".

(05 marks)

ii. Describe briefly the relationship between emotions and individual development.

(07 marks)

iii. Examine the teacher's role in relation to the balanced emotional development in student.

(08 marks)

14. Write short notes on any **three (03)** of the following themes.

i. Importance of heredity and environment towards one's development.

ii. Differences between the experimental method and non-experimental methods in studying student behaviour.

iii. Behavioural characteristics of childhood and adolescence.

iv. Vygotsky's theory of cognitive development.

(6 x 3 +2 = 20 marks)

(Total 100 marks)

- *Copyrights reserved* -